# බුද්ධානුස්ති භාවනාව

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ සියළු රාග, ද්වේශ, මෝහ දුරු කළ සේක. සියළු කුසල් දහම් දියුණු කළ සේක. උතුම් සමාධිය දියුණු කළ සේක. ආශ්චර්යවත් වූ ප්‍රඥාවක් ඇති කරගත් සේක. සියළු කෙලෙසුන් කෙරෙන් නිදහස් වූ සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ ඇසින් රූප දැක ඒ රූප කෙරෙහි නොඇලුන සේක, නොගැටුණ සේක, මුලා නොවුන සේක, ආශාව දුරු කළ සේක. කණින් ශබ්ද අසා ඒ ශබ්ද කෙරෙහි නොඇලුන සේක, නොගැටුණ සේක, මුලා නොවුන සේක, ආශාව දුරු කළ සේක. නාසයෙන් ගඳ සුවඳ දැන ඒ ගඳ සුවඳ කෙරෙහි කෙරෙහි නොඇලුන සේක, නොගැටුණ සේක, මුලා නොවුන සේක, ආශාව දුරු කළ සේක. දිවෙන් රස විඳ ඒ රසය කෙරෙහි කෙරෙහි නොඇලුන සේක, නොගැටුණ සේක, මුලා නොවුන සේක, ආශාව දුරු කළ සේක. කයින් පහස ලබා ඒ පහස කෙරෙහි කෙරෙහි නොඇලුන සේක, නොගැටුණ සේක, මුලා නොවුන සේක, ආශාව දුරු කළ සේක. මනසින් අරමුණු සිතා ඒ අරමුණු කෙරෙහි කෙරෙහි නොඇලුන සේක, නොගැටුණ සේක, මුලා නොවුන සේක, ආශාව දුරු කළ සේක.

බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ **අරහං** වන සේක, **අරහං** වන සේක, **අරහං** වන සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අවබෝධ කළ යුතු වූ, දුක නම් වූ ආර්ය සත්‍යය පරිපූර්ණ වශයෙන් අවබෝධ කොට වදාළ සේක. ප්‍රහාණය කළ යුතු වූ දුකේ හටගැනීම නම් වූ ආර්ය සත්‍යය, පරිපූර්ණ වශයෙන්ම ප්‍රහාණය කොට වදාළ සේක. සාක්ෂාත් කළ යුතු වූ දුක නිරුද්ධ නම් වූ ආර්ය සත්‍යය, පරිපූර්ණ වශයෙන්ම සාක්ෂාත් කොට වදාළ සේක. ප්‍රගුණ කළ යතු වූ දුක් නිරුද්ධ කිරීම පිණිස පවතින ප්‍රතිපදාව නම් වූ ආර්ය සත්‍යය, පරිපූර්ණ වශයෙන්ම ප්‍රගුණකොට වදාළ සේක. මේ චතුරාර්ය සත්‍යය ධර්මයන් සත්‍ය ඤාණ වශයෙන්ද, කෘත්‍ය ඤාණ වශයෙන්ද, කෘත ඤාණ වශයෙන්ද පරිවර්ත තුනකින් යුතුව ආකාර දොළොසොකින් යුතුව පරිපූර්ණ වශයෙන් ගුරු උපදේශ රහිතව අවබෝධ කොට වදාළ නිසා **සම්මාසම්බුද්ධ** වන සේක, බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන්ම **සම්මාසම්බුද්ධ** වන සේක, **සම්මාසම්බුද්ධ** වන සේක, **සම්මාසම්බුද්ධ** වන සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ සෘද්ධි බල ඤාණ ලබාගත් සේක. ඕනෑම දෙයකට සවන් දිය හැකි දිව්‍ය ශ්‍රවණ ඤාණ ලබාගත් සේක. ඕනෑම දෙයක් දැකිය හැකි දිව්‍ය නේත්‍ර ඤාණ ලබාගත් සේක. ඕනෑම කෙනෙකුගේ සිත් දකින්නාවූ අනුන්ගේ සිත් දන්නා ඤාණ ලබාගත් සේක. ඕනෑම කෙනෙකුගේ සිතක ඇති වාසනා ගුණ දැකීමේ හැකියාව වූ ඉන්ද්‍රිය පරෝපරියත්ත ඤාණය ලබාගත් සේක. ඕනෑම කෙනෙකු සසර ගෙවූ ආකාරය දැකීම නම් වූ පුබ්බේනිවාසානුස්සති ඤාණය ලබාගත් සේක. ඕනෑම කෙනෙක් කර්මානුරූපව චුතවන ආකාරයද, කර්මානුරූපව උපදින ආකාරයද දැකීමේ ඤාණය චුතූපපාත ඤාණය ලබාගත් සේක. ඔබ වහන්සේ තුළ පැවති සියළු කෙළෙසුන් නැතිකොට නිකෙලෙස් බව දන්නාවූ ආසවක්ඛය ඤාණය ලබාගත් සේක.

බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ, ඒ ඤාණයන්ට අනූවම ජීවිතය ගතකළ සේක. අනන්ත සිල් ඇතිව ජීවිතය ගතකළ සේක. මනා සංවරයෙන් ජීවිතය ගතකළ සේක. හැම ක්ෂණයෙහිම හැම මොහොතෙහිම ඉතා සිහියෙන් යුතුව ජීවිතය ගතකළ සේක. අප්‍රමාණ වීරියෙන් යුතුව ජීවිතය ගතකළ සේක. අටලෝ දහමට කම්පා නොවී ජීවිතය ගතකළ සේක. ඉතා බලවත් වූ සමාධි සමාපත්තියෙන් යුතුව වැඩසිටි සේක. අනන්ත විමුක්තිය ඇති සිතින් ගතකළ සේක. බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන්ම **විජ්ජාචරණ සම්පන්න** වන සේක. **විජ්ජාචරණ සම්පන්න** වන සේක. **විජ්ජාචරණ සම්පන්න** වන සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අවබෝධ කොට වදාළ ඒ ආර්ය අෂ්ටාංගික මාර්ගය නම්

වූ ඒ මධ්‍යම ප්‍රතිපදාව ඒකාන්තයෙන්ම සුන්දරයි. ඒ සුන්දර වූ මධ්‍යම ප්‍රතිපදාව තුළ තම ජීවිතය දියුණු කොට ඒ අමා නිවන වූ පරම සුන්දර නිවන සාක්ෂාත් කොට වදාළ නිසා බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන්ම **සුගත** වන සේක. **සුගත** වන සේක. **සුගත** වන සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ සියළු බ්‍රහ්මලෝකද, සියළු දිව්‍යලෝකද, මේ මිනිස් ලෝකයද, සතර අපාය ආදී සියළු ලෝකයන්ගේ යථා ස්වභාවය අවබෝධ කරගෙන මේ සියළු ලෝක වලින් නිදහස් වී වදාළ නිසා බුදුරජාණන් වහන්ස ඔබ වහන්සේ ඒකාන්තයෙන්ම **ලෝකවිදූ** වන සේක, **ලෝකවිදූ** වන සේක, **ලෝකවිදූ** වන සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ දමනය කිරීමට නොහැකි වූ අකීකරු දෙවියන්වද, අකීකරු බඹුන්වද, අකීකරු මිනිසුන්වද මහා කරුණාවෙන් දමනය කොට, මහා ප්‍රඥාවෙන් දමනය කොට, ඉර්ධි ප්‍රාතිහාර්යයෙන් දමනය කොට දහමට කීකරු කරවා අමාමහ නිවනට පමුණුවා වදාළ නිසා බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන්ම **අනුත්තරෝපුරිසදම්මසාරථී** වන සේක, අනුත්තරෝපුරිසදම්මසාරථී වන සේක, **අනුත්තරෝපුරිසදම්මසාරථී** වන සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ දෙව්ලොව දෙවියන්ගේද, මනුලොව මිනිස්සුන්ගේද එකම ශාස්තෘන්වහන්සේ වන සේක. බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන්ම **සත්ථාදේවමනුස්සානං** වන සේක, **සත්ථාදේවමනුස්සානං** වන සේක, **සත්ථාදේවමනුස්සානං** වන සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අවබෝධ කොට වදාළ ඒ උතුම් චතුරාර්ය සත්‍යය ධර්මය අන් අයටද අවබෝධ කරගැනීම පිණිස ඉතා පැහැදිලි ලෙස ඉතා සුන්දර ලෙස පැහැදිලි වචන වලින් පැහැදිලි අර්ථ වලින් දේශනා කොට වදාළ නිසා බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන්ම **බුද්ධ** වන සේක, ඒකාන්තයෙන්ම **බුද්ධ** වන සේක, ඒකාන්තයෙන්ම **බුද්ධ** වන සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ලොවේ වෙන කිසිවෙකුට නොදැරිය හැකි මේ උතුම් සම්බුදු ගුණයන් ඔබ වහන්සේ දරා වැඩ සිටි නිසා භාග්‍යවන්ත වනසේක. ලොවේ වෙන කිසිවෙකුට නැති ආශ්චර්යවත් වූ ප්‍රඥාවකින් වැඩ සිටි නිසා භාග්‍යවත් වූ සේක. ලොවේ වෙන කිසිවෙකුට නැති මහා කරුණාවෙන් සිසිල් වී ගිය හද ම!ලක් ඇති නිසා භාග්‍යවන්ත වන සේක. බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ ඒකාන්තයෙන්ම **භගවා** වන සේක, **භගවා** වන සේක, **භගවා** වන සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස මගේ මේ පුංචි හිතට ඔබ වහන්සේගේ ගුණ කඳ අනන්තයි අප්‍රමාණයි, බුදුගුණ අනන්තයි අප්‍රමාණයි.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඒ බුදුගුණ අනන්තයි. අප්‍රමානයි. බුදුගුණ අනන්තයි, බුදුගුණ අනන්තයි......

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ, මම සරණ ගිය, එකම ශාස්තෘන් වහන්සේ වන සේක, බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ මම සරණ ගිය එකම ශාස්තෘන් වහන්සේ වන සේක. බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේ මම සරණ ගිය එකම ශාස්තෘන් වහන්සේ වන සේක, මාගේ ජීවිතය වැනසී ගියද මම වනාහී කිසිම දිනයක නිවන් දකිනා මොහොත දක්වා ඔබ වහන්සේගෙන් බැහැරට නොයමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මාගේ ජීවිතයට එකම ආලෝකය වන සේක. එකම පිළිසරණ වන සේක, එකම සැනසිල්ල වන සේක, එකම සැනසිල්ල වන සේක, ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම වනාහී ඔබ වහන්සේ සරණ ගිය ඔබ වහන්සේගේ ශ්‍රාවකයා වෙමි. මම කිසිත් නොදනිමි. ඔබ වහන්සේ මාගේ ජීවිතය ගැන, සියළු දෙය දන්නා සේක, මාගේ ජීවිතයට සැනසිල්ල වන සේක, සැනසිල්ල වන සේක, සැනසිල්ල වන සේක.